**225 ශ්‍රී ලංකා පොලීසිය**

**------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

ශ්‍රී ලංකා පොලීසියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 අගෝස්තු 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පොලිසියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරි දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුම අනුව දෙසැම්බර් 31 දිනට ශේෂය රු.885,556,999 ක් වූ අතර එදිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු එකතුව රු.805,583,741 ක් විය. ඒ අනුව රු.79,973,258 ක වෙනසක් නිරීක්ෂණය විය. එම වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂිකව දෝෂ හඳුනාගෙන කටයුතු කිරීම නිසා 2015 වර්ෂයේ සිට වෙනස ක්‍රමිකව අඩු වේ. | ශේෂයන්ගේ වෙනස්කම් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දේපල පිරියත හා උපකරණ වර්ෂය අග වටිනාකම ACA - 6 අනුව රු.26,160,839,028 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර වත්කම් වාර්තාව අනුව වටිනාකම රු.41,946,843,876 ක් වූයෙන් රු.15,786,004,848 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරමි. | මෙම වෙනස්කම් සඳහා අදාල කරුණු අනාවරණය කර ගත යුතු අතර කඩිනමින් නිවැරදි කළ යුතුය. |

(ඇ) **ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ගණන් දීමේ නිලධාරී විසින් සිදුකල යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, පනතේ 38 (2) වගන්තිය ප්‍රකාරව එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, ශ්‍රී ලංකා පොලිසිය විසින් එවැනි සමාලෝචනයක් සිදු කල බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇති අතර ඒ සම්බන්ධව උප ගිණුම් ඒකකයන්හි සිදුකරන අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා මගින් හෙලිවන කරුණු පදනම්කර ගනිමින් අවශ්‍ය වෙනස්කම් සිදුකිරීමට කටයුතු කර ඇත. තවද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා අභ්‍යන්තර පාලන ක්‍රමවේද පිළිබඳව සමාලෝචනය කර අවශ්‍ය වෙනස්කම් සිදු කිරිමට කටයුතු කර ඇත. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහනුවර පොලිස් කොට්ඨාශයේ ගොඩනැගිලි 78 කට අදාලව ගෙවිය යුතු හිඟ වරිපනම් මුදල රු.මිලියන 2.37 ක් වූ අතර ඒ අතරින් මහනුවර පොලිස් ස්ථානය හා පොලිස් කොට්ඨාශ කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලට පමණක් හිඟ වරිපනම් මුදල රු.මිලියන 1.83 ක් විය. | හිඟ බිල්පත් ලබාගෙන අනුමැතියට ඉදිරිපත්කර මෙම හිඟ මුදල කඩිනමින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | හිඟ වරිපනම් මුදල් කඩිනමින් නිරවුල් කළ යුතුය. |

2.2 බැරකම් හා බැඳීම් වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඇ) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇත්නම් විනා සේවාවන් හෝ සැපයුම් සඳහා කිසිම බැඳීමකට බැඳී නොසිටිය යුතු වුවත්, ප්‍රවර්ථන වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා රු.16,133,896 ක් හා මූලධන වැය විෂයයන් 05 ක් සඳහා රු.134,046,332 ක් වශයෙන් වැය විෂයයන් 10 ක ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.150,180,228 ක් බැරකම් සඳහා එළඹී තිබුණි. | ජනතාවට අවශ්‍ය සේවාවන් අඛන්ඩව පවත්වාගන යාම සඳහා අත්‍යවශ්‍ය වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇතිකර ගැනීමට සත්භාවයෙන් කටයුතු කර ඇත. | ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් ඇතිකර නොගත යුතුය. . |

2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් දෙපාර්තුමේන්තු පොත් අනුව හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂයක් නොතිබුණ ද ගොඩනැඟිලි කොට්ඨාශය විසින් හබරාදූව නිල සෙවණ නිවාස මිල දී ගැනීම වෙනුවෙන් 2019 වර්ෂයේ ගෙවූ රු.මිලියන 500 ක් හා ඉදිකිරීම් ව්‍යාපෘති වෙනුවෙන් රු.මිලියන 85.68 ක් අත්තිකාරම් ලෙස පැවති අතර නිරවුල් කර නොතිබුණි. | නිවාස ඒකක 192 ක් මිලදී ගැනීමට අත්තිකාරම් ලෙස රු. මිලියන 500 ක් ගෙවා ඇත. විකුණුම්කරු නියමිත දිනදී ඉදිකිරීම් අවසන් නොකිරීම නිසා ගොඩනැගිලි භාර නොගන්නා ලදී. | අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |

| | | |
|---|---|---|
| 2013 වර්ෂයේදී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු. 11,503,192 ක මුදලක් අදාල කාර්යය සඳහා උපයෝජනය නොකර වසර 07 කට වැඩි කාලයක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | අළුතින් ආරක්ෂිත දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීම සඳහා යොදා ගැනීමට නියමිත බැවින් තැන්පත් ගිණුමේ රඳවාගෙන ඇත. | අදාල අරමුණු සඳහා ප්‍රතිපාදන උපයෝජනය කල යුතුය. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යභාරයන් ඉටු නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2011 අංක 44 දරන ජාතික පොලිස් අභ්‍යාස ආයතන පනතේ V කොටසේ ඇතුලත් 'මුදල්' සම්බන්ධ කටයුතුවලට අදාල "ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අරමුදල" පිහිටුවීම හා පනතේ ඊට අදාල 22 සිට 28 දක්වා වූ කාර්යයන් හා කර්තව්‍යයන් සිදුව නොතිබුණි. | 2021 වර්ෂයේ අයවැය මගින් මෙම අරමුදල පිහිටුවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ගැනීමට තීරණය වි ඇත. | "අරමුදල" පිහිටුවා අදාල නියමයන් ප්‍රකාර කටයුතු කළ යුතුය. |
| (ආ) පොලිස් ත්‍යාග අරමුදල හැර ශ්‍රී ලංකා පොලීසිය යටතේ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 61 ක් පැවති අතර 2020 දෙසැම්බර් 31 දිනට එම අරමුදල් වල මුදල් ශේෂ එකතුව රු.මිලියන 103.37 ක් ද ස්ථාරව තැන්පතුවල ආයෝජන වටිනාකම රු.මිලයන 331.93 ක් ද විය. මෙම අරමුදල් සම්බන්ධයෙන් වූ අරමුදල් කළමනාකරණය, අයවැය, ගිණුම් තැබීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරිම සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 876 හා 877 ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | පොලිස් සුබවිහරණ අරමුදල නිලධාරින්ගේ සුභසාධන අවශ්‍යතාවන් සඳහා පවත්වාගන යාම සිදුවේ. මෙම අරමුදල පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරිමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3.2 **අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

---

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1865 අංක 16 දරණ පොලිස් ආඥා පනත සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය හා සංශෝධන සිදුකල යුතු ක්ෂේත්‍ර 16 ක් ද 2014 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. වර්තමාන හා අනාගත සමාජීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැලපෙන අයුරින් යාවත්කාලීන කර සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබූ අතර 2021 ජූනි මාසය වන විටත් පනත සංශෝධනය වී නොතිබුණි. | මහජන අදහස් හා යෝජනා විමසීමක් සිදුකර ඇත. | හඳුනාගත් ක්ෂේත්‍රයන්ට අදාලව පනත සංශෝධනය කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා පොලීසිය සඳහා විශ්ව විද්‍යාලයක් ස්ථාපිත කිරීමට 2015 වර්ෂයේදී හඳුනාගෙන තිබූ අතර යෝජිත විශ්ව විද්‍යාලය සඳහා අත්තිඩිය ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තෝරාගෙන තිබුණි. ඒ සඳහා බ්‍රිතාන්‍ය නෝටින්හැම්, ලිවර්පූල් මෙන්ම ඕස්ට්‍රේලියානු ඩීකින් විශ්ව විද්‍යාලයන්හි සහාය ලබා ගැනීමටත් සැලසුම්කර තිබුණ ද විශ්ව විද්‍යාලය පිහිටුවීමට අවශ්‍ය පනත සම්මත කර ගැනීම 2021 ජූනි මස වන විටත් සිදුකර නොතිබුණි. | ජාතික පොලිස් සහ අපරාධ යුක්ති විශ්ව විද්‍යාලය ස්ථාපිත කිරීමට පනතක් කෙටුම්පත් කර ඇත. | විශ්ව විද්‍යාලය පිහිටුවීමට අදාල නීති කටයුතු කඩිනමින් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා පොලීසියේ තත්කාලීනව පවත්නා අඩුපාඩු හා දුර්වලතා හඳුනාගෙන නිසි පරිදි යාවත්කාලීන කිරීමට යෝජනා ඉදිරිපත් කිරීමටත් අනාගතයේ යහපත් සහ කාර්යක්ෂම පොලිස් සේවාවක් රටතුළ ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීමේ අරමුණින් පිහිටුවා තිබූ කමිටුවේ වාර්තාව | පර්යේෂණ හා සංවර්ධන කොට්ඨාශය මගින් අධ්‍යයන සිදුකිරීම, නිර්දේශ ඉදිරිපත් කිරීම, විෂය පථය හඳුනා ගැනීම, සංඛ්‍යා දත්ත රැස්කිරීම වැනි පියවරයන් ක්‍රියාත්මක කරමින් සිටී. | හඳුනාගෙන ඇති ප්‍රතිසංවිධාන කටයුතු සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| "පොලිස් ප්‍රතිසංවිධාන ක්‍රියාකාරී සැලැස්ම" ලෙස 2017 මැයි 31 දින එළිදක්වා තිබුණද 2021 ජූනි දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ඇ) දඩමුදල් අයකරගැනීම වේගවත් කිරීමත් රාජ්‍ය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහල නැංවීමත් මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණින් රථ වාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම් කරමින් පැවතියද මේ දක්වා අදාල ක්‍රමය ස්ථාපිත කර නොතිබුණි. | ICTA විසින් සකස්කර ඇති ක්‍රමවේදය සඳහා 2021.05.05 දින විද්වත් කමිටුවේ අනුමැතිය ලැබුණු අතර කාල පරාසය ඇතුලත් සැලසුම් වාර්තාව ඉදිරිපත් කර ඇත. | හඳුනාගත් අරමුණු ඉටුවන ආකාරයට ස්වයංක්‍රීය දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2019 අංක 10 දරණ මෝටර් වාහන (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් මෝටර් රථ වාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අයකිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරිම 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදුකරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි දත්ත පරිගණක ගත කිරීමේ ක්‍රමයක් ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදුකරන වරදකරුවන් ගෙන් නිවැරදි දඩ මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ICTA යටතේ විද්‍යුත් ක්‍රමවේදය අනුව ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී සැලසුම්කර ඇත. | රථවාහන නීති කඩකරන වැරදිකරුවන් එම වරද සිදුකරන වාර ගණන හඳුනාගත හැකි පරිගණක දත්ත පද්ධතිය ස්ථාපිතකර ඒ අනුව නියමිත දඩ මුදල් අයකිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදනය**

**--------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **-------------------------------------** | **------------------------------------** | **----------------------** |
| (අ) පොලිස් සැරයන් හා පොලිස් | හිස්වැසුම් 60,000 ක් මිලදී ගැනීම | නිලධාරීන්ට අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | කොන්ස්තාපල් නිලධාරීන් සඳහා හිස්වැසුම් 75,000 ක් රු.93,455,119 කට මිලදී ගැනීමට 2011 වර්ෂයේ ආරම්භ කර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදුව තිබූ අවිධිමත් කරුණු නිසා බේරුම්කරණයේදී 2017 ජනවාරි 21 දින ලබා දී තිබූ තීන්දුව වූ හිස්වැසුම් 75,000 සඳහා වූ මුදල සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ගෙවීම ශ්‍රී ලංකා පොලිසිය විසින් ප්‍රතික්ෂේප කරමින් අඛණ්ඩව අධිකරණ ක්‍රියාමාර්ගයක යෙදී තිබුණි. 2020 අගෝස්තු මාසය වන විට මෙම හිස්වැසුම් මිලදී ගැනීම සඳහා රු.191,768,632 ක් ද අනෙකුත් ගාස්තු ලෙස රු.45,316.880 ක් ද ගෙවීමට නියමිතව තිබුණි. 2021 ජූනි මාසය වන විටත් අධිකරණ කටයුතු අවසන්ව නොතිබුණු අතර සැපයුම් කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වැඩිවීමේ අවාසියද ශ්‍රී ලංකා පොලිසිය දැරිය යුතුබවට සැපයුම්කරු ඉල්ලා තිබුණි. | සඳහා දෙපාර්ශවයේ එකඟතාවය මත යෝජනාවක් උසාවිය වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා උසාවියේ අවසරය ලද වහාම මිලදී ගැනීමට කටයුතු කරමි. | හිස්වැසුම් අවශ්‍ය අවස්ථාවේදී ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පොලිසියේ රාජකාරී ඉටු කිරීමට නව ජීප්රථ මිලදී ගැනීමේ අවශ්‍යතාවය හදුනාගෙන 2018 අගෝස්තු 08 දින අමප/18/1650/828/10-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ජීප් රථ 750 ක් (විශේෂ කාර්ය බලකාය සඳහා ජීප්රථ 150 ක් ඇතුළුව) රු. මිලයන 14,100 කට ඉන්දියානු ණය යෝජනා ක්‍රමය (Indian Line of Credit) යටතේ මිලදී ගැනීමට සැලසුම් කර තිබුණි. වසරකට ජීප් රථ 250 බැගින් වසර 03ක් තුල මිලදී ගැනීමට සැලසුම් කළ ද මීට අදාල ප්‍රසම්පාදන කටයුතු 2021 ජූනි මාසය වන විටත් අවසන්ව නොතිබුණි. | අදියර 03 යටතේ ජීප් රථ 250 බැගින් මිලදී ගැනීමට එගකතාවයකට පැමිණ ඇත. ලංසු කැඳවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | ජීප් රථ අවශ්‍යතාවය ඉටු කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | අත්තිඩිය පොලිස් විශ්ව විද්‍යාලය සඳහා ලී ඇඳන් 180 ක් මිලදී ගැනීමට රු. මිලියන 2.61 ක් ගෙවා තිබුණි. | ඉදිරියේදී පිරිවිතර සකස් කිරීමේදී පෙන්වා දුන් අඩුපාඩු නිවැරදිකර ගැනීමට කටයුතු කරමි. | නිවැරදි පිරිවිතරයන් මත භාණ්ඩ මිලදී ගැනීම සිදුකල යුතුය. |

මීට අදාල තාක්ෂණික පිරිවිතරයේ ලී වර්ගය, අඳක දිග හා පළල යන අවම කරුණු පමණක් ඇතුලත් කර අසම්පූර්ණ පිරිවිතරයක් මත ඇගයීම් සිදුකර භාණ්ඩ සපයා ගෙන තිබුණි.

3.4 **වත්කම් කළමනාකරණය**

**-----------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**

| | විගණන නිරීක්ෂණය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහනුවර පොලිස් කොට්ඨාශයට අයත් පොලිස් ස්ථාන 04 ක්, නිවාඩු නිකේතනයක් පොලීසියට අයත් නොවන භූමි තුල පවත්වාගෙන යන අතර එම දේපළ පවරා ගැනීමේ කටයුතු 2021 අප්‍රේල් මාසය වන විටත් අවසන්ව නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමට කටයුතු කරමින් සිටී. | කඩිනමින් ඉඩම් නිරවුල් කරගත යුතුය. |
| (ආ) | නාරාහේන්පිට පොලිස් රෝහල පුළුල් කිරිම සඳහා 2018 වර්ෂය අවසාන වන විට රු. මිලියන 334 ක් වැය කර ඉදිකළ මහල් 6 කින් සමන්විත ගොඩනැගිල්ලේ මහල් 4 ක් 2021 ජූනි මාසය වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. | කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පවතී. | ගොඩනැගිල්ලේ ඌන උපයෝජිතව පවතින මහල් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පොලිස් අධ්‍යයන ආයතනයක් ස්ථාපිත කිරිමට මල්වාන පිහිටි අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක් වූ ඉඩම ශ්‍රී ලංකා පොලීසියට පවරා දීම සඳහා 2017 ජුනි මස 20 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණද 2021 ජුනි මස වන විටත් පවරාගෙන නොතිබුණි. | ඉඩම පවරා ගැනීම සඳහා මැනුම් කරන ලෙස මැනුම්පති වෙතින් ඉල්ලීමක් කර ඇත. පොලීසිය සඳහා වෙන්කර ගැනීමෙන් පසුව අත්කර ගැනීමේ කටයුතු ආරම්භ කලහැකිවේ. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි මෙම ඉඩමෙහි පවරාගැනිම පිළිබඳ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. |
| (ඇ) | පොලිස් අශ්වාරෝහක කොට්ඨාශය හා රණවිරු සුරැකුම් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2017.09.28 දින භුක්තිය භාරදී තිබූ හොරණ ඇල්ලකන්ද වත්ත ඉඩමේ අක්කර 75 ක භූමිය අදාල අරමුණ සඳහා යොදාගැනීමට කටයුතු කර | වැට නවීකරණය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. | ඇල්ලකන්ද වත්ත අක්කර 75 ක භූමිය අදාල අරමුණු සඳහා යොදවා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොතිබුණි. ඉඩම වටා වැටක් ඉදිකිරීමට යෝජනාවී තිබුණද එය ද ක්‍රියාත්මක වී නොතිබුණි. | | |
| (ඉ) සපුගස්කන්ද පොලිස් ස්ථාන පිහිටි අක්කර 04 ක ඉඩමෙන් අක්කර 02 ක පමණ භූමියක් 1981 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පවතී. | මෙම භූමියේ පොලිස්පති ගබඩාවක් ඉදිකිරීමට මේ වන විට සැලසුම් කර ඇත. | ඌන උපයෝජිත ඉඩම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) පේරාදෙනිය පොලිස් ස්ථානය ස්ථාපිත කිරීම සඳහා පේරාදෙනිය විශ්ව විද්‍යාලය විසින් 1995 ජනවාරි 04 දින ලබා දී තිබූ ඉඩම ආපසු භාරදීමේ එකඟතාවය මත නව පොලිස් ස්ථානය පිහිටි භූමියේ ඉදිකිරීම් සිදුකරගෙන යාමට අවසර ලැබී තිබිණි. 2019 දෙසැම්බර් 18 දින පැරණි පොලිස් ස්ථානය පිහිටි භූමිය විශ්ව විද්‍යාලය වෙත භාරදී තිබුණද නව පොලිස් ස්ථානය ඉදිකර ඇති භූමිය 2021 අප්‍රේල් මාසය දක්වාත් පොලිසිය වෙත පවරාගෙන නොතිබුණි. | මෙම ඉඩම පවරාගැනීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යවරයා වෙතින් ඉල්ලීමක් සිදුකර ලිපියක් යොමුකර ඇත. | ඉඩම පවරාගැනීමේ කටයුතු කඩිනම්කළ යුතුය. |

3.5 **අනාර්ථික ගණුදෙනු**

**---------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2008.03.19 දින උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා වැඩ ආරම්භකර 2018 වර්ෂය අවසාන වන විට රු.8,895,273 ක් වැයකර තිබුණද ඉදිකිරීම් අතරමග නැවතී තිබුණි. 2008 වර්ෂයේ පොලීසියට පවරා දී තිබූ අක්කර 06 ක මෙම භූමියද නිරවුල්කර ගැනීමෙන් තොරව පැවතුණි. | යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය සඳහා ඉඩමෙන් කොටසක් ලබාදීමට සිදුව ඇත. මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් වාර්තාව ලද පසු ඉදිරි කටයුතු සිදු කිරිමට යෝජිතය. | රු.8,895,273 ක් වැයකර ඉදිකිරීම් ආරම්භකර අතරමග නතර කර දමා තිබෙන උසස් පුහුණු පොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට කඩිනමින් කටයතු කළ යුතුය. පවරා දී තිබෙන අක්කර 6 ක භූමියද කඩිනමින් නිරවුල් කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) හබරාදුව "නිල සෙවණ" නිවාස යෝජනා ක්‍රමයෙන් නිවසක් රු. 3,800,000 බැගින් රු.729,600,000 කට නිවාස 192 ක් මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ තිබුණි. 2019 අප්‍රේල් 02 දින වන විට රු. මිලියන 500 ක් අවස්ථා 05 කදී අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. විධිමත් පරිදි වැඩ අවසන්කර නිවාස භාර ගැනීම සම්බන්ධයෙන් වූ ගැටළු 2021 මැයි මස අගවන විටත් නිරවුල්ව නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | අත්තිකාරම් මුදල් ගෙවා වසර 02 ක් ඉක්මවා පවතින බැවින් නිවාස භාරගැනීමට අදාල ගැටළු කඩිනමින් විසඳීමට ක්‍රියාකල යුතුය. |

3.6 **කළමනාකරණ දුර්වලතා**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) විගණනයට ඉදිරිපත් කල සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේ අයවීම් හිඟ හිටි තිබුණු නිළධාරීන් 3,267 ක ගෙන් අයවිය යුතු ශේෂ වල එකතුව රු.74,295,356 ක් වූ අතර වර්ෂ 03ට වැඩි හිඟ හිටි ණය ශේෂවල එකතුව රු.54,829,167 ක් වී තිබුණි. | 2020 වර්ෂයේ අළුතින් එකතුවී ඇති රු. 11,005,492 ක ණය ශේෂයක් සමඟ ණය ශේෂවල එකතුව රු.74,295,356 ක් වී ඇත. | හිඟ හිටි ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) නැති වූ හෝ සොරකම් කරන ලද භාණ්ඩ හදුනාගැනීමේ ක්‍රමවේදය (SAIS) යටතේ පොලිස් ගැසට් පත්‍ර III හි පලකර මෙතෙක් හදුනා ගැනීමට අපොහොසත් වූ සොරකම් කරන ලද භාණ්ඩවල එකතුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට 59,118 ක් වූ අතර ඒ අතර පාපැදි 29,261 ක්, තුවක්කු 12,493 ක් රථවාහන 10,390 ක් හා විවිධ දේපළ 6,974 ක් විය. පොලිස් ස්ථාන විසින් වසර 10 කට පෙර වාර්තා කර තිබූ මෙතෙක් හදුනා ගැනීමට අපොහොසත් වූ සොරකම් | දේපළ නැතුවූ බවට වාර්තාකර ඇතත් නැවත හමුවීමක් සම්බන්ධව අපරාධ ලේඛනාගාරය වෙත වාර්තාකර නොමැති අවස්ථා සම්බන්ධයෙන් කටයුතු කිරිම උපදෙස් ලබා දී ඇත. | පොලිස් ස්ථාන විසින් අදාල තොරතුරු ලබා දීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| කරන ලද භාණ්ඩ ප්‍රමාණය සියයට 90 ක් විය. 2020 වර්ෂය තුලදී යතුරු පැදි 45 ක් ත්‍රීරෝද රථ 17 ක් ඇතුළු මෙම හඳුනා ගැනීමේ ක්‍රමවේදයට වාර්තා වී තිබූ සොරකම් කරන ලද දේපළ ප්‍රමාණය 174 ක් වූ අතර පොලිස් ස්ථාන විසින් කෘෂි උපකරණ 3 කට අදාලව පමණක් හඳුනාගත් බවට තොරතුරු වාර්තා කර තිබුණි. මේ අනුව තොරතුරු වාර්තා කිරීමේ ප්‍රමාදයන් සහ නැති වූ දේපළ පොලිස් ස්ථාන විසින් සොයාගැනීමේ ප්‍රමාදයන්ද පැවතුණි. | | |
| (ඈ) සමාලෝචිත වර්ෂය තුල කාන්තාවන්ට එරෙහි බල අපරාධ සිද්ධි 595 ක් වාර්තා වී තිබූ අතර වර්ෂය අවසාන වන විට එයින් සිද්ධි 376 කට අදාලව විමර්ශන අවසන්ව නොතිබුණි. වැඩිම සිද්ධි ප්‍රමාණයක් වාර්තා වී තිබුණේ ස්ත්‍රී දූෂණය, බරපතල තුවාල සිදු කිරීම හා මිනී මැරීම සම්බන්ධයෙන් විය. එම අපරාධ වලට අදාල සිද්ධි පිළිවෙලින් 237ක්, 174 ක් හා 82ක් වූ අතර විසඳීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 41, සියයට 37, හා සියයට 30, මට්ටමේ විය. වර්ෂය තුල කාන්තාවන් ඝාතන සිද්ධි 82 ක් වාර්තා වී තිබූ අතර වර්ෂය අවසාන වන විට 57 ක් තව දුරටත් විමර්ශන මට්ටමේ පැවතුණි. | මේ වන විට විසඳීමේ ප්‍රතිශතය මීට වඩා ඉහල අගයක් ගත යුතුය. | කාන්තාවන්ට එරෙහි බල අපරාධ සිද්ධි සම්බන්ධ විමර්ශන අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) ළමයින්ට එරෙහි බල අපරාධ සිද්ධි 3,162 ක් වර්ෂය තුල වාර්තා වී තිබූ අතර එයින් සිද්ධි 2,003 කට අදාලව එනම් සියයට 63 කට අදාලව විමර්ශන අවසන්ව නොතිබුණි. ඒයටතේ වැඩිම සිද්ධි වාර්තා වී තිබුණේ ස්ත්‍රී දූෂණය, අපහරණය හා බරපතල ලිංගික අපයෝජනය යන සිද්ධි සම්බන්ධයෙන් විය. එම අපරාධවලට අදාල සිද්ධී පිළිවෙලින් 1,638 ක්, 632 ක් හා 615 ක් වූ අතර විසඳීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට | මේ වන විට විසඳීමේ ප්‍රතිශතය මීට වඩා ඉහල අගයක් ගත යුතුය. | ළමයින්ට එරෙහි අපරාද විසඳීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 35, සියයට 37 හා සියයට 43 තරම් අඩු ප්‍රතිශතයක පැවතුණි. ළමයින්ට එරෙහි මිනී මැරීම් සම්බන්ධ සිද්ධි 22 ක් වාර්තා වී තිබූ අතර එයින් විසඳීමේ ප්‍රතිශතය සියයට 28 මට්ටමේ පැවතුණි. එමෙන්ම ළමයින්ට එරෙහි මිනි මැරීමට තැත් කිරීමේ සිද්ධි 09 ක් වර්ෂය තුල වාර්තා වී තිබූ අතර එම සිද්ධි 09 ටම අදාලව විමර්ශන අවසන්ව නොතිබුණි. | | |
| (ඉ) | අත්අඩංගුවට ගනු ලබන සැකකරුවන්ගේ විස්තර නියාමනය කිරීමේ නව ක්‍රමවේදය (AMIS) අනුව අපරාධ කොට්ඨාශයේ දත්ත සමඟ සැසඳීමෙන් වෙනත් වැරදි සඳහා අවශ්‍ය පුද්ගලයින් ද යන්න තහවුරු කර ගනී. අපරාධ කොට්ඨාශයේ දත්ත පද්ධතිය අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලියා පදිංචි අපරාධ කරුවන් 56,666 ක්ද, විවෘත වරෙන්තු කරුවන් 69,762 ක් ද යුධ හමුදාවෙන් පලාගිය පුද්ගලයන් 7,657 ක් ද ගුවන් හමුදාවෙන් පලාගිය පුද්ගලයන් 6,741 ක් ද හා නාවික හමුදාවෙන් පලා ගිය පුද්ගලයන් 11,437 ක් ද වශයෙන් එකතුව පුද්ගලයන් 152,263 කගේ තොරතුරු දත්ත පද්ධතිය තුල පැවතුණි. මේ අතරින් ගුවන් හමුදාවෙන් පලා ගිය තැනැත්තන් සැකකරුවන් ලෙස හඳුනාගැනීම සියයට 25 ක් ද, නාවික හමුදාවෙන් පලාගිය තැනැත්තන් සැකකරුවන් ලෙස හඳුනා ගැනීම සියයට 16 ක් ද හා ලියාපදිංචි අපරාධ කරුවන් සැකකරුවන් ලෙස හඳුනා ගැනීම සියයට 13 ක් ද වී තිබුණි. මේ අනුව දත්ත පද්ධතියේ තොරතුරු තැනැත්තන් සැකකරුවන් ලෙස හඳුනා ගැනීමේ ප්‍රවනතාවයක් ඇති බැවින් පොලිස් ස්ථාන මට්ටමින් ඔවුන්ගේ කටයුතු නියාමනය කිරීමේ අවශ්‍යතාවයක් පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | AMIS දත්ත පද්ධතියට ඇතුලත්කර ඇති පුද්ගලයන්ගේ කටයුතු විමර්ශනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) මත්ද්‍රව්‍ය භාවිතාකර සිටින පුද්ගලයන්ට නීතිමය දඩුවම් පැමිණවීමට පසුබිමක් සකස්කර නොතිබූ අතර, එවැනි පුද්ගලයන් හඳුනාගැනීමේ උපකරණ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය හෝ පොලිස් ස්ථාන සතුව නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් නීතිය ඉදිරියට පැමිණවීමට නීති සම්පාදනය හා අදාල අංශ වෙත උපකරණ ලබා දිම සිදු කල යුතුය. |
| (උ) මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදී වාර්තා ලැබීමට මාස 03 – 06 ත් අතර කල් ගතවූ අවස්ථා 08 ක් ද, මාස 06ට වැඩියෙන් කල්ගතවූ අවස්ථා 70 ක් ද හඳුනාගෙන තිබුණි. එබැවින් මත්ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා කඩිනම් හා විධිමත් වැඩපිළිවෙලක අවශ්‍යතාවයක් පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මත්ද්‍රව්‍ය හඳුනාගැනීමේ ක්‍රමවේදය කඩිනම් කළ යුතුය. |
| (ඌ) 2020 වර්ෂයේදී මාරක අනතුරු 95 ක් ඉක්ම වූ හා බරපතල තුවාල අනතුරු 300 ක් ඉක්මවූ පොලිස් කොට්ඨාශ 04 ක් පැවති අතර ඒවා අනුරාධපුරය, ගම්පහ, කුරුණෑගල හා නුගේගොඩ පොලිස් කොට්ඨාශ විය. මෙම පොලිස් කොට්ඨාශ 04 හි සිදුවන මාරක හා බරපතල අනතුරු සංඛ්‍යාව, මුළු මාරක හා බරපතල අනතුරු සංඛ්‍යාවෙන් සියයට 20 ඉක්මවා 2018 - 2020 කාලය පුරාම පැවතීමත් නිසා අනතුරු අවම කිරිම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. | පසුව පිළිතුරු ඉදිරිපත් කරමි. | මාරක හා බරපතල අනතුරු ඉහල අගයක් ගෙන ඇති පොලිස් කොට්ඨාශවල එම අනතුරු අවම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (එ) 2020 වර්ෂයට අදාල සැකකරුවන් හඳුනානොගත් අනතුරු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව පිළිබඳ කොට්ඨාශය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පසුව පිළිතුරු ඉදිරිපත් කරමි. | සැකකරුවන් හඳුනා නොගත් අනතුරු සම්බන්ධ වාර්තාව ඉදිරිපත් කල යුතුය. |
| (ඒ) හලාවත පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථාන 06 ක හා අනුරාධපුර | පසුව පිළිතුරු ඉදිරිපත් කරමි. | වේගසීමා කඩවීම් පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු |

| | | |
|---|---|---|
| පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථාන දෙකක තිබූ වේග සීමා පරීක්ෂා කිරීමේ උපකරණ වසර 10 කට වඩා පැරණිවීම මත අක්‍රියවීමෙන් වේගසීමා නඩු ලබාගෙන නොතිබූ අතර, පොළොන්නරුව පොලිස් කොට්ඨාශයේ පොලිස් ස්ථාන දෙකක වේගසීමා උපකරණ පැවතියද 2019 හා 2020 වර්ෂවල වේගසීමා නඩු ලබා ගෙන නොතිබුණි. | | කල යුතුය. |

4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම
------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පැවති අතර, ශ්‍රී ලංකා පොලීසිය තිරසර සංවර්ධනය අරමුණු 04 ක් යටතේ ඉලක්ක 08 ක් හඳුන්වාගෙන තිබුණි. පාදක වර්ෂය 2016 යොදාගනිමින් දර්ශකයන් ගොඩනැගීම සිදුකරමින් පැවතියද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | අවශ්‍යවන සංධිස්ථානයන් හඳුනාගෙන නියාමනය කළ යුතුය. |

5. **මානව සම්පත් කළමනාකරණය කිරීම**
---------------------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**

| **විගණන නිරීක්ෂණය** | **ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2017 – 2020 කාල පරිච්ඡේදය තුල කාන්තා සහකාර පොලිස් අධිකාරි | විභාග දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී කටයුතු කරමින් | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| තනතුර සඳහා බඳවා ගැනීම් සිදුකර නොතිබීම නිසා 2020 වර්ෂය අවසානයේ අනුමත තනතුරු 16 න් 15 ක් පුරප්පාඩුව පැවතුණි. | පවති. | |
| (ආ) සේවය සඳහා 2020 වර්ෂය තුලදී උප පොලිස් පරික්ෂක නිලධාරීන් 23 ක් ද, කාන්තා උප පොලිස් පරික්ෂක නිලධාරින් 06 ක් ද නව බඳවා ගැනීම් යටතේ බඳවාගත් පසුවද සහායක සේවා කාර්ය මණ්ඩලයේ තනතුරු 14 ක් සඳහා තවදුරටත් පවතින පුරප්පාඩු වෙනුවෙන් නිලධාරීන් 3,923 ක් බඳවාගෙන නොතිබුණි. මෙම තත්ත්වය ශ්‍රී ලංකා පොලීසියේ වෛද්‍ය කොට්ඨාශය, ගොඩනැගිලි කොට්ඨාශය, තොරතුරු තාක්ෂණ කොට්ඨාශය වැනි අංශයන්ගේ රාජකාරී උපරිම කාර්යක්ෂමතාවයකින් සිදුකර ගෙන යාමට බාධාවක් වී තිබුණි. | සහායක සේවා වෘත්තීන් 34 කට අදාල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත කර ඇති අතර පුරප්පාඩු පිරවීම ආධුනිකයන් බඳවා ගන්නා කොට්ඨාශය විසින් සිදු කරනු ලබයි. | සහායක සේවයේ අනුමත කාර්යමණ්ඩලයේ ඇති පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඇ) සිවිල් කාර්ය මණ්ඩලය තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වූ තනතුරු 14 අතර ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III පන්තියේ සහකාර අධ්‍යක්ෂවරයෙකුගේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ III වන පන්තියේ නිලධාරීන් 12 දෙනෙකුගේද තෘතීය මට්ටමේ රාජ්‍ය කළමනාකාරණ සහකාර අධි ශ්‍රේණියේ පරිපාලන නිලධාරී තනතුරු 06 ක ද පුරප්පාඩු පැවතුණි. මෙම තත්ත්වය ශ්‍රී ලංකා පොලීසියේ සැලසුම් සම්පාදන කටයුතු, ගණකාධිකරණ කටයුතු හා මානව සම්පත් කළමනාකරණ කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අදාල අංශ වෙත ලිපි යොමුකර ඇත. | සිවිල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |